# ප්‍රසම්පාදන දැන්වීමයි.

## සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

## මහ රෝහල(ශික්ෂණ), පේරාදෙණිය

සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,මහ රෝහල(ශික්ෂණ), පේරාදෙණිය විසින් රෝහලට අවශ්‍ය වායු සමීකරණ යන්ත්‍ර සපයා සවි කිරීම, වාට්ටු අංක 07/08 පුළුල් කිරීම, වැසි ජලය ගලා බැසීම සඳහා (ලේ බැංකුව අසල) කාණු පද්ධතිය සකස් කිරීම හා යන ප්‍රසම්පාදන කාර්යයන් සඳහා 2025 පෙබරවාරි මස 14 වන දින සිට 2025 මාර්තු මස 07 වන දින ප.ව.2.00 දක්වා මුද්‍රා තැබූ මිළ ගණන් කැඳවනු ලැබේ.

- ලංසු ලියවිලි නිකුත් කිරීම - 2025.02.14 දින සිට පේරාදෙණිය මහ රෝහලෙහි නිළ වෙබ් අඩවිය වන www.peradeniya-hospital.health.gov.lk වෙතින් බාගත කර ගැනීමෙන් ලබා ගත හැක.
- ලංසු ලියවිලි භාරගන්නා අවසන් දිනය හා වේලාව - 2025.03.07 දින ප.ව.2.00
- ලංසු විවෘත කිරීම - 2025.03.07 දින ප.ව. 2.00

02. ප්‍රසම්පාදන කටයුතු සඳහා ආපසු නොගෙවන ලංසු ලේඛණ ගාස්තු වශයෙන් පහත සඳහන් මුදල පේරාදෙණිය මහ රෝහලේ සරප් වෙත ගෙවීමෙන් හෝ පේරාදෙණිය මහජන බැංකුවේ **ගිණුම් අංක 057100129025207** දරණ සෞඛ්‍ය ලේකම්ගේ ගිණුමට බැරකර ඊට අදාල ලදුපත ලංසු ලියවිලි සමග ඉදිරිපත් කල යුතුය.

03. පේරාදෙණිය මහ රෝහල් නිළ වෙබ් අඩවිය වන www.peradeniya-hospital.health.gov.lk වෙතින් බාගත කර නොගත් ලංසු ලේඛණ සහ ලංසු ලේඛණ ගාස්තු ගෙවන ලද ලදුපත ඉදිරිපත් කරනු නොලබන ලංසු ලේඛණ ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. **පූර්ව ප්‍රසම්පාදන රැස්වීම් -**
මෙම වැඩ විෂයෙහි ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් වන පූර්ව ප්‍රසම්පාදන රැස්වීම 2025.02.21 දින පෙ.ව.10.30ට පේරාදෙණිය මහ රෝහලේ දේශණ ශාලා අංක 02 හිදී පැවැත්වේ.

| අනු අංකය | ප්‍රසම්පාදන කාර්යය | ආපසු නොගෙවන ලංසු ගාස්තු(රු.) | ලංසු ඇපකරයේ වටිනාකම(රු.) |
|---|---|---|---|
| 01. | වායු සමීකරණ යන්ත්‍ර සපයා සවි කිරීම | 4,000.00 | 200,000.00 |
| 02. | වාට්ටු අංක 07/08 පුළුල් කිරීම | 20,000.00 | 1,050,000.00 |
| 03. | වැසි ජලය ගලා බැසීම සඳහා (ලේ බැංකුව අසල) කාණු පද්ධතිය සකස් කිරීම | 2,500.00 | 120,000.00 |

05. ලංසු ලේඛණ සම්පූර්ණ කර ලියාපදිංචි තැපෑලෙන් "සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන මණ්ඩලය, මහ රෝහල, පේරාදෙණිය" යන ලිපිනයට "මුල් පිටපත" හා "අනු පිටපත" වශයෙන් සඳහන් කර එක් ලියුම් කවරයක බහා එවිය හැක. නැතහොත් අතින් ගෙනැවිත් මෙම රෝහලේ ගණකාධිකාරි කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැක. ටෙන්ඩර් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාල වැඩ විෂයයේ නම පැහැදිලිව සඳහන් කළ යුතුය.
ලංසු ලේඛණ සම්පූර්ණයෙන් පිළිගැනිම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රාදේශීය ප්‍රසම්පාදන මණ්ඩලය සතුවේ.

වෛද්‍ය,ප්‍රියන්ත ජීවරත්න,
නි. අධ්‍යක්ෂ,
මහ රෝහල ( ශික්ෂණ),
පේරාදෙණිය.